**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය නොකල මතය**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය නොකල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමට අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු.97,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.79,917,430 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. මෙයින් රු.32,500,000 ක්ම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන සර්වර් යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම, පද්ධතිය ස්ථාපිත කිරීමට හා නඩත්තු කිරීමේ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 30 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට ගෙවා තිබුණි. මේ සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර අදාල කාර්යය මාස 06 ක් වැනි කාලයක් තුල ඉටු කළ යුතුව තිබුණි.<br><br>එහෙත් අදාල කාර්යය 2020 සැප්තැම්බර් මාසය අවසාන වන විටත් සිදු කර නොතිබුණි. 2020 පෙබරවාරි 20 දිනැති අංක අමප/20/0139/215/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නැවත ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලෙස දන්වා ඇතත් 2020 සැප්තැම්බර් මාසය අවසාන වන විටත් යන්ත්‍රය මිලට ගැනීම හෝ විකල්ප ක්‍රියාමාර්ගයක් හෝ ගෙන නොතිබුණි. | වැය කරනු ලබන මුදල් වලට උපරිම ප්‍රතිලාභ ලබා ගත යුතුය. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී. |

## 3. යහපාලනය

### 3.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණකවරයෙකු ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පත් කර නොතිබුණි. එමෙන්ම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන චක්‍රලේඛයට අනුවද මේ දක්වා කටයුතු කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා නිකුත් කර නොතිබුණි. | ආයතනයේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුය. | 2019 අප්‍රේල් 06 දින සිට අනුමත කර ඇති අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධරයකු අනුයුක්ත කර දෙන මෙන් හා එතෙක් වැඩබලන නිලධරයකු හෝ මෙම කාර්යාලයට අනුයුක්ත කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත සේවක සංඛ්‍යාව 100 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 70 ක් විය. ඒ අනුව පැවති පුරප්පාඩු සංඛ්‍යාව සියයට 30 ක් විය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුය. | පුරප්පාඩු තනතුරු බඳවා ගැනීමට දැනටමත් කටයුතු කරමින් යන බව දක්වා ඇත. |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යන තනතුරු අනුමත කළ දින සිට පුරප්පාඩුව පැවති අතර මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ ලිපි හුවමාරු කරගෙන තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩු පැවතුණි. | -එම- | එම තනතුරු සඳහා නිලධරයන් අනුයුක්ත කර දෙන මෙන් ලිපි මඟින් ඉල්ලීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෘතියික මට්ටමේ භාෂා පරිවර්තක තනතුරු 2 ක් පුරප්පාඩුව පැවතුන අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1120 හා 2016 දෙසැම්බර් 30 දිනැති ලිපිය මගින් පේටන්ට් පරීක්ෂක තනතුරු 10 ක් අනුමත කර තිබුණු අතර අංක DMS/1120 හා 2016 දෙසැම්බර් 20 දිනැති ලිපිය මගින් සංවර්ධන නිලධාරී තනතුරු 30 ක් අනුමත කර තිබුණි. එහෙත් එම තනතුරු වලින් පිළිවෙලින් තනතුරු 9 ක් හා 2 ක් 2020 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. | -එම- | එකඟ වෙමි. එම තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර දෙන මෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීම් කර ඇත. |